# 12 වන ඒකකය - ඊ - වානිජ්‍ය සංකල්පය හා අන්තර්ජාල ව්‍යාපාර

1. ඊ වානිජ්‍ය තුළදී මුදල් ගෙවීම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන මාධ්‍යයක් **නොවන්නේ**

1. Credit Card
2. Debit Card
3. Smart Card
4. Electronic fund transfer
5. Business Cheques

2. E.bay.com වෙබ් අඩවියට යොමු වී පියුමි විසින් කැමරාවක් ලබා ගැනීම සඳහා තම ක්‍රෙඩිට් කාඩ් පතෙන් මුදල් ගෙවීමක් සිදු කරයි. එම ගනුදෙනුව අයත් වන්නේ,

1. B2B
2. B2C
3. B2G
4. G2C
5. B2E

3. ඊ - වානිජ්‍ය වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණුවලට අයත් **නොවන්නේ,**

1. ආරක්ෂාව
2. පෞද්ගලිකත්වය
3. වේගය
4. පාරිභෝගික ප්‍රමාණය
5. නීතිමය ගැටළු

4. E – Market place යනු,

1. අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ හා සේවා අලෙවිකිරිම හා ලබා ගැනීමට ව්‍යාපාරිකයන් හා පාරිභෝගිකයන් කටයුතු කරන වෙබ් අඩවි වේ.
2. විද්‍යුත් උපාංග අලෙවි කරනු ලබන වෙළඳපොල වේ.
3.ඊමේල් හරහා අලෙවි කටයුතු සිදු කරන ක්‍රමවේදයකි
4.ආයතන විසින් තම තොරතුරු ප්‍රදර්ශනය කිරීමට භාවිතා කරන වෙබ් අඩවි සමුහයක් වේ.
5. අන්තර්ජාලයේ භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා පමණක් ස්ථාපිත කර ඇති වෙබ් අඩවියක් වේ.

5. ඊ- වානිජ්‍යයේ වාසියක් **නොවන්නේ,**

1.අඩු පිරිවැයකින් ප්‍රචාරණය කිරීමේ හැකියාව
2. භෞතික සීමාවකින් තොරව ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමේ හැකියාව
3. පැය 24 පුරාම ව්‍යාපාරික කටයුතුවල නිරත වීමේ හැකියාව
4. අන්තර්ජාල පහසුකම් සියලු දෙනාටම නොමැති වීම නිසා අන්තර්ජාලයට ඊ- වානිජ්‍යට යොමු වීමේ අපහසුව
5.ආකර්ෂණීය ආකාරයෙන් අලෙවිකරන කටයුතු සිදු කිරීමේ හැකියාව

6. අන්තර්ජාලය තුළදී පුද්ගලයින්ට අවශ්‍ය වන බොහෝ තොරතුරු එක් ස්ථානයකින් ලබාගත හැකි ලෙස සකසා ඇති වෙබ් අඩවි හඳුන්වන්නේ ,

1. E- Commerce site
2. Service provider
3. Web Portal
4. E- Distributor
5. E- Purchaser

7. නිවසේ හෝ කාර්යාලයේ සිට තමාට අවශ්‍ය භාණ්ඩ හා සේවා අන්තර්ජාලය තුළින් ගෙන්වා ගැනීම හඳුන්වන්නේ.

1. අන්තර්ජාල වෙළඳාම
2. මාර්ගගත සාප්පු යාම
3. ඊ- ව්‍යාපාර
4. ඊ- අලෙවිකරණය
5. ඊ- වෙළඳාම

8. ඊ- වානිජ්‍ය තුල දක්නට ලැබෙන ආකෘති අතරින් රජයට සම්බන්ධ ආකෘතිය වන්නේ

1. B2B
2. C2C
3. C2B
4. B2C
5. G2C

9. සේවාදායකයින්ට තම කාලය ඉතිරි කර ගැනීමට උපකාර වෙමින් අන්තර්ජාලය වැනි මාධ්‍යයන්ගෙන් තොරතුරු සොයාදීම මගින් යම් මුදලක් උපයාගන්නා පුද්ගලයන් හෝ ආයතනයන් හඳුන් වන්නේ,

1. වෙළඳ පර්යේෂකයන්
2. තොරතුරු තැරැව්කරුවන්
3. සමීක්ෂකයන්
4. සමාජ වෙබ් අඩවි ජාල හිමියන්
5. අන්තර්ජාල සේවාසපයන්නන්

10. ප්‍රවෘත්ති, බ්ලොග්ස්, වීඩියෝ, සින්දු වැනි නිතර අලුත් කරන තොරතුරු වැනි දෑ මාර්ගගතව සැපයීම හඳුන්වනු ලබන්නේ

1.අන්තර්ජාල වෙළඳ ප්‍රදර්ශනාගාර
2. ඊ- ව්‍යාපාර
3. තොරතුරු තැරැව්කරුවන්
4. ප්‍රතිවෙන්දේසි
5 අන්තර්ගතය සපයන්නන්

**<u>පිළිතුරු</u>**

1. 5
2. 2
3. 4
4. 1
5. 4
6. 3
7. 2
8. 5
9. 2
10. 5

**<u>සකස් කළේ -</u>**

**ජී.එන්.කෞෂල්‍යා මිය,**

**ර/රාජකීය විද්‍යාලය.**